# මහා පරාක්‍රමබාහු රජු විසින් සිදුකරන ලද තුන් නිකා සාමග්‍රිය බුදුසසුනේ චිරස්ථිතිය උදෙසා හේතු වූයේ කෙසේ ද?

පී. මංජුලා උදයකුමාරි[1]

**හැඳින්වීම:**

ශ්‍රී ලංකා ශාසන ඉතිහාසයේ සිදු වූ අතිශය වැදගත් සිදුවීමක් ලෙස මහා පරාක්‍රමබාහු රජතුමාගේ අනුග්‍රහයෙන් සිදු කරන ලද තුන් නිකා සාමග්‍රිය ඉතිහාසගත වේ. වළගම්බා රාජ්‍ය කාලයේ ඇති වූ නිකාය භේදය නිසාවෙන් අනාගත පාලකයන් අඩු වැඩි වශයෙන් ඒ ඒ නිකායන්ට අනුග්‍රහ දැක් වූ අතර එම නිකාය භේදය සමථයකට පත් කිරීමට නොයෙකුත් රජවරුන් නන් ආකාරයෙන් වෑයම් කළ ද ඒවා සර්වප්‍රකාරයෙන් ම සාර්ථක නොවුණි. නමුත් නිකාය සාමග්‍රිය සිදු කිරීමෙහි ලා මහා පරාක්‍රමබාහු රජු සමත් වූ අතර ඒ සඳහා බෙහෙවින් උපස්තම්භක වූයේ ඒ සඳහා යොදාගන්නා ලද ක්‍රියාමාර්ගයන් ය. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ මහා පරාක්‍රමබාහු රජතුමා විසින් තුන් නිකා සාමග්‍රිය සිදු කරන ලද්දේ කෙසේ ද යන්නත්, එම ක්‍රියාමාර්ගය බුදුසසුනේ චිරස්ථිතිය උදෙසා හේතු වූයේ කෙසේ ද යන්නත් විමර්ශනය කිරීම යි.

**මූලාශ්‍රය:**

මූලාශ්‍රය වශයෙන් යොදාගන්නා ලද්දේ ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රයන් ය. මහාවංසය, නිකාය සංග්‍රහය ආදී ප්‍රාථමික මූලාශ්‍ර, පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්, ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය යනාදී ද්විතීයික මූලාශ්‍ර පරිශීලනය කරන ලදී.

**අධ්‍යයන ක්‍රමවේදය:**

අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රයන්හි අන්තර්ගත තත් මාතෘකාවට අදාළ කරුණු කෙරෙහිත්, මේ සම්බන්ධයෙන් විවිධ විද්වතුන් විසින් ඉදිරිපත් කර ඇති මතවාද කෙරෙහිත් විශේෂ අවධානය යොමු කරන ලද අතර පුස්තකාල භාවිතයෙන් ද දත්ත රැස් කරන ලදී.

---

[1] සහකාර කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, manjuhis88@gmail.com

**ප්‍රතිඵල:**

මෙම පර්යේෂණයෙන් ලැබුණු ප්‍රතිඵලය වූයේ තුන්නිකා සාමග්‍රිය බුදුසසුනේ චිරස්ථිතිය සඳහා හේතු වූ ආකාරය අනාවරණය කරගැනීමට හැකි වීම යි.

**විස්තෘත සාරසංක්ෂේපය:**

ලංකා ශාසන ඉතිහාසයේ සදානුස්මරණීය සිදුවීමක් වන තුන් නිකා සාමග්‍රිය ක්‍රි.ව. 1164-1165 වර්ෂයේදී සිදු කරන ලද බව මූලාශ්‍රයට අනුව පැහැදිලි වේ. මෙසේ නිකාය සමගියක් සිදු කිරීමට හේතු වී ඇත්තේ මහණදම් අමතකකොට අප්‍රතිපත්ති, දුෂ්ප්‍රතිපත්තිවල නියැලුණු සංඝයාගෙන් ශාසනය කිලිටිවීම නිසා එයින් ශාසනය මුදා ගැනීමටත්, දුර්ලබ්ධි ව්‍යාප්තිය නිසා කෙලෙසුණු බුදුදහම බේරා ගැනීමටත් ය. මහාවංසය සඳහන් කරන්නේ පරාක්‍රමබාහු රජතුමා මහා කාශ්‍යප ස්ථවිරයන් ප්‍රධාන කොටගත් සංඝයාගෙන් සමන්විත වූ විනිශ්චය මණ්ඩලයක සහයෝගයෙන් නිකාය භේදය සමහන්කොට මහාවිහාර, අභයගිරි, ජේතවන යන ත්‍රෛනිකාය සමගි කළ බව යි.

අසංවරය, වත්පිළිවෙත් නොසැලකීම, ආධ්‍යාත්මික ගුණධර්මයන්ගෙන් පිරිහීම යනාදිය මෙකල භික්ෂූන් අතර පැවති දුෂ්ප්‍රතිපත්ති බව පෙනේ. "අඥාන දුර්ඥාන මූලික අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති විෂවේග විහතවැ අපායාපන්න වන ශාසනාවචර කුලපුත්‍ර" යනාදී වශයෙන් පොළොන්නරු කතිකාවතේ එන විස්තරයෙන් මෙකල භික්ෂූන් පිරිහී සිටි අන්දම පැහැදිලි වේ. මෙවැනි භික්ෂූන් නිකායත්‍රයෙහි ම සිටින්නට ඇත. පරාක්‍රමබාහු රජතුමා ප්‍රථමයෙන් සිදු කළේ මහා විහාර නිකාය ශෝධනය කිරීම යි. මෙහිදී රජතුමා ධර්මාශෝක අධිරාජයා ගත් මග අනුගමනය කළ බව පෙනේ. ඒ අනුව එම භික්ෂූන් අතර සිටි යථා තත්ත්වයට පත් කළ හැකි භික්ෂූන් ප්‍රකෘතිමත් කරන ලදී. ලාභාපේක්ෂාව තකා සසුන්ගත ව සිටි දුශ්ශීල භික්ෂූන්ට උසස් තනතුරු ප්‍රදානයකර ඔවුන්ගේ සිවුරු හළහ. ඇතැමුන් සසුන්ගත ව සිටියේ බඩ රැක ගැනීමේ අපේක්ෂාවෙනි. මෙසේ පළමු ව මහාවිහාර භික්ෂූන් පිරිසිදු කොට එම භික්ෂූන් අතර සමගියක් ඇති කළේ ය.

මීළඟට අභයගිරි සහ ජේතවන භික්ෂූන් මහාවිහාර භික්ෂූන් සමග සමගි කිරීමට උත්සාහ කරන ලදී. මහාවංසය සඳහන් කරන්නේ අභයගිරි සහ ජේතවන දෙනිකායෙහි උපසපන් ශීලය රැකි එක් භික්ෂුවක්වත් නොසිටි බව යි. එම භික්ෂූන් අතරින් බොහෝ දෙනෙක් සාමණේර තත්ත්වයට පත්කොට අනෙක් භික්ෂූන්ට තනතුරු ප්‍රදානයකොට උපැවිදි කරන ලදී. නමුත් මේ දෙනිකායේ සියලු ම භික්ෂූන් දුශ්ශීලයන් ලෙස සැලකීම සාධාරණ නොවන බව හැඟේ. නමුත් මූලාශ්‍රගත

තොරතුරු අනුව එකල අඹුදරුවන් රක්ෂා කළ ශ්‍රමණ වෙසින් සිටියවුන් සංඝ ග්‍රාමයන්හි ජීවත් වී ඇත. මෙමගින් ඔවුන් තම පැවිද්දට හානි කරගත්තා පමණක් නොව, ශ්‍රමණ වෙසින් සිටිමින් සමාජයේ ගරු සැලකිලි ද ලැබී ය.

තුන් නිකායිකයන් අතර විවිධ ප්‍රතිවිරුද්ධ මතධාරීහු සිටියහ. ඔවුන් විනය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් හා ධර්මය සම්බන්ධයෙන් පරස්පර විරෝධී අදහස් දැරී ය. ඒ අනුව සංඝ සාමග්‍රියේදී නිකාය ත්‍රිත්වය අතර පැවති ගැටලු විශේෂ සැලකිල්ලට භාජනය වන්නට ඇත. විනය විශාරද වූ මහා කාශ්‍යප තෙරුන් ප්‍රමුඛ විනයධර, ත්‍රිපිටකධර භික්ෂූන් විනිශ්චය මණ්ඩලය ලෙස යොදා ගැනීමෙන් බුදුදහම රැකගෙන ශාසන චිරස්ථිතිය ඇතිකරලීමට ඉමහත් පිටිවහලක් වන්නට ඇතැයි සිතිය හැකි ය. සංඝ සාමග්‍රියට ආරාධනා ලැබූ භික්ෂූන් අතර තුන් නිකායට ම අයත් භික්ෂූන් සිටි බව පෙනේ. එය භික්ෂූන් අතර ඒකීයත්වයක් ඇති කිරීමට ඉවහල් වන්නට ඇත. භික්ෂූන් අතර පැවති අප්‍රතිපත්ති, දුෂ්ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිරවද්‍ය විසඳුමක් ලබා දීමටත් මෙමගින් හැකියාව ලැබෙන්නට ඇතැයි සිතිය හැකි ය.

සංඝ සාමග්‍රියෙන් පසු එක් නිකායක් ලෙසින් කටයුතු කිරීමට සංඝයා වහන්සේට ඉඩ ලැබුණු අතර වළගම්බා රාජ්‍ය කාලයේ සිට පැවත ආ නිකාය භේදය සමථයකට පත්වීම සිදුවිය. එතෙක් අනෙක් නරවරයන්ට කළ නොහැකි වූ භාරදූර කාර්යයක් කිරීම තුළින් පරාක්‍රමබාහු රජතුමා බුද්ධ ශාසනයට කළේ මහත් සේවයකි. නිකාය සමගිය නිසාවෙන් භික්ෂූන් අතර පැවති මතවාද සහ ගැටුම් සමනය වී ඔවුනොවුන්ගේ සහනශීලීත්වය වර්ධනය වූ අතර සිල්වත්කම ඇති විය. එය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් සෘජුව ම බලපෑ බව කිව හැකි ය.

සංඝ සාමග්‍රිය සිදුකිරීමෙන් පසු පොළොන්නරු කතිකාවත පිහිටුවන ලදී. සංඝ සාමග්‍රියෙන් ඇතිවූ සිල්වත් භික්ෂු පිරිස සහ ඉදිරියේදී සසුන්ගතවන සංඝයා ද දුෂ්ප්‍රතිපත්තිවලින් වළකා ශාසනය චිරාත් කාලයක් පවතින පරිදි පිළියම් යෙදීම සිදුවූයේ මෙම කතිකාවතෙනි. එහි ඇතැම් ව්‍යවස්ථාවලින් දුෂ්ප්‍රතිපත්තිවලින් වැළකී සිටීමට නිර්දිෂ්ට කරන අතර ඇතැම් ව්‍යවස්ථා අනුගමනය කළ යුතු වත් පිළිවෙත් සම්බන්ධයෙන් පැනවූ ඒවා ය.

මෙසේ අනුගමනය කළයුතු පිළිවෙත් සහ දුරුකළ යුතු දුෂ්ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කතිකාවතේ එන ව්‍යවස්ථා උල්ලංඝනය කරන්නවුන්ට දඬුවම් පැමිණවීමට ද නිර්දේශකොට තිබේ. එසේ දඬුවම් කිරීමේ බලය ගණදෙටු තෙරවරුන් සතුවිය. නමුත් ඔවුන් ද නියමිත කටයුත්ත නිසිලෙස ඉටු නොකළේනම් දඬුවම් ලැබීමට භාජනය විය. එවැන්නවුන්ට දඬුවම් පැමිණවීම මහතෙරවරුන් සතුවිය. වරදකරුවන්ට තෙවරක් අවවාද කළයුතු වූ අතර එයත් නොසලකා නැවත වැරදි කළහොත් නිස නොදී මාසයක් සිටිය යුතුවේ. එවිට ද නිවැරදි ව නොසිටියේ නම් එම පැවිද්දා සමග තිබෙන සම්බන්ධතා අත්හැර දමන ලෙස නිර්දිෂ්ට ය.

මෙසේ අනුදැන ඇත්තේ පළිගැනීමේ චේතනාවෙන් නොව, භික්ෂූන් යහමගට ගැනීමේ අරමුණෙන් ය. කතිකාවතෙන් මෙවැනි ව්‍යවස්ථා පැනවීම නිසා සංඝ සාමග්‍රියෙන් සිදුවූ ශාසනයේ සුපිරිසිදු බව, භික්ෂූන් අතර සමගිය තවදුරටත් තහවුරු වන්නට ඇත. එසේ ම කතිකාවත් නියමයන් අනුව පැවතීමට භික්ෂූන් මේ නිසා විශේෂ සැලකිල්ලක් දක්වන්නට ඇත.

එසේ ම නිකාය සමගියෙන් පසු ග්‍රන්ථ, විදර්ශනා ධූර දෙක පදනම් කරගත් ග්‍රාමවාසය හා ආරණ්‍යවාසය ලෙසින් දෙපාර්ශවයක් සංඝ සංවිධානය අතර ඇති වූයේ ය. මෙය බොහෝ කාලයක් නිකාය භේදයක් ඇති නොවීමට උපස්ථම්භක විය.

**නිගමනය**

මෙතෙක් සාකච්ඡාවට භාජනය කළ මහා පරාක්‍රමබාහු රජු විසින් සිදුකළ තුන් නිකා සාමග්‍රිය බුදුසසුනේ දියුණුව, චිරස්ථිතිය වෙනුවෙන් මහත්සේ හේතු වූ බව පැහැදිලි ය. වත් පිළිවෙත් අතපසු නොකොට සිදු කිරීම, ධර්ම ඥානය වර්ධනය කරගැනීම වෙනුවෙන් උත්සාහවත් වීම, කායික, වාචසික සංවරය ඇති කර ගැනීම යනාදිය භික්ෂූන් තුළ වර්ධනය කරලීමට මෙම තුන් නිකා සාමග්‍රිය ඉමහත් පිටිවහලක් වූයේ ය. එය වඩාත් තහවුරු වීම කෙරෙහි පොළොන්නරු කතිකාවතින් ද සැලකිය යුතු මෙහෙවරක් ඉටු වූ අතර භික්ෂූන් ඒ අනුව ක්‍රියා කරන්නට උත්සුක වීම නිසා ගැටුමකින් තොර ව දිගු කලක් ශාසනය පවත්වාගෙන ඒමට තුන්නිකා සාමග්‍රිය උපස්ථම්භක වූ බව අවසාන වශයෙන් නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පද** : සංඝ සාමග්‍රිය, දුෂ්ප්‍රතිපත්ති, චිරස්ථිතිය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*ඌනපූරණසහිතො මහාවංසො,* (1959). පොල්වත්තේ, බුද්ධදත්ත හිමි. කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

*නිකාය සංග්‍රහය,* (2002). (සංස්.) ඩී.වී.ආර්. සමරනායක, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

*පූජාවලිය,* (1926). (සංස්.) කිරිඇල්ලේ, ඤාණවිමල හිමි, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

ධම්මවිසුද්ධි හිමි, යටදොළවත්තේ. (1995). පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්, කැලණිය: පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය.

*Epigraphia Zeylanica*, (1964). Vol.1, Paranavithana, S. Published by the Government of Ceylon.